සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2018

07 ශ්‍රේණිය

# පුරවැසි අධ්‍යාපනය

කාලය පැය 02 යි.

නම/ විභාග අංකයඃ

## I - කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.
- ප්‍රශ්න අංක 1- 5 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියා දක්වන්න.

01. පොදු සමාජ පැවැත්ම සඳහා පුරවැසියන් විසින් තම තමන්ට පැවරෙන කාර්යයන් ඉටුකිරීම .................. වේ.
(වගකීම් / වගවීම් / යුතුකම්)
02. දැඩි ආත්ම විශ්වාසයකින් හා දැඩි කැපවීමෙන් කටයුතු කර ඕනෑම අභියෝගයක් ජයගත හැකි බව .................................................. ලෝකයාට ප්‍රකාශ කළාය.
(ලුවීබ්රේල් / විල්මා රුඩොල්ෆ් / ඈන් ෆ්‍රෑන්ක්)
03. එක් එක් සංස්කෘතියට ............................................................................ වූ සුවිශේෂී සංස්කෘතික ලක්ෂණ පවතී.
(ආවේණික / ඒකාකාරී / විවිධාකාර)
04. එක් පරම්පරාවකින් තවත් පරම්පරාවකට සංස්කෘතිය පවරාදීමේ කාර්යය සිදුකරනු ලබන මූලිකම ඒකකය .................................................. වේ.
(පාසල / ආගමික ස්ථාන / පවුල)
05. මිනිසාගේ සියලුම වැඩකටයුතු සංස්කෘතිය වන බව ප්‍රකාශ කරන ලද්දේ ............................................. විසිනි.
(ඒබ්‍රහම්ලින්කන් / ඊ.බී. ටයිලර් / ඩඩ්ලි සියර්ස්)

- ප්‍රශ්න අංක 06 - 10 දක්වා ප්‍රශ්නවල ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

06. සමාජය තුළ යහපත් පුරවැසියකු ලෙස කටයුතු කිරීමේ දී වෙනත් සංස්කෘතීන්ට ගරු කිරීම ආරක්ෂාකිරීම තුළින් සමාජ ඒකාබද්ධතාවය ඇතිවේ. (..........)
07. නැකතට ලිප් ගිනි මෙලවීම හා හිසතෙල් ගෑමේ චාරිත්‍රය දක්නට ලැබෙන්නේ සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවයේ දී ය. (..........)
08. ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩාව ලෙස සලකන අත්පන්දු ක්‍රීඩාව ලොව ප්‍රථමවරට ආරම්භ වන්නේ බ්‍රිතාන්‍යයේ හෝලියොක් නගරයේ ය. (..........)
09. නා ගස ''නාගකේශර'' යන නමින් හඳුන්වන්නේ පාලි හා සංස්කෘත භාෂාවලිනි. (..........)
10. යහපත් පුද්ගලයා සැප සම්පත්වලින් පිරිහුණ ද ගුණ යහපත්කම් පරිපූර්ණව පවතී. (..........)

- අංක 11 - 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.

11. මිනිසා විසින් ප්‍රගුණ කළ යුතු මානව ගුණාංගයක් වන්නේ මින් කුමක් ද?
(1) අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම. (2) අන් අයට ආදරය කිරීම.
(3) කලහකාරී ගතිපැවතුම් ඇතිකර ගැනීම. (4) ආත්මාර්ථකාමී බව.
12. අයිතිවාසිකම්වල දක්නට ලැබෙන ලක්ෂණයක් වන්නේ,
(1) පවුල තුළින් පමණක් හිමිවීම. (2) අසල්වැසියන්ගෙන් පමණක් හිමිවීම.
(3) අසීමිත වී පැවතීම. (4) සමාජය තුළින්ම හිමිවීම.
13. වර්තමාන පවුල් ඒකක මුහුණපාන අභියෝගයක් ඇතුලත් වරණය තෝරන්න.
(1) පවුලේ සාමාජිකයින්ට දෙමාපිය ආරක්ෂාව උපරිමයෙන් ලැබීම.
(2) දරුවන්ට දෙමාපියන්ගේ ආදරය නිරන්තර නොඅඩුව ලැබීම.
(3) පවුලේ සාමාජිකයන්ගේ රැකවරණය සඳහා බාහිර පුද්ගලයන්ගේ සහය ලබාගැනීමට සිදු වීම.
(4) මව පියා නිවස ආසන්නයේම රැකියාවල නිරත වීම.

14. ශ්‍රී ලංකාවේ ජාතික පක්ෂියා ලෙස සැලකෙන වළිකුකුළා තුළ දැකිය හැකි සුවිශේෂී චර්යා රටාවක් වන්නේ,
   (1) උදාසීන කලහකාරී බවින් යුතු සත්වයෙකු වීම. (2) අහිංසක මෙන්ම කඩිසර බවින් යුතු සත්වයෙකු වීම.
   (3) අභියෝග හමුවේ පසුබසින සත්වයෙකු වීම. (4) හුදෙකලාව වෙසෙන සත්වයෙකු වීම.

15. ජාතික කොඩිය භාවිතයේ දී නොකළ යුතු කරුණ ඇතුලත් වරණය වන්නේ,
   (1) සිංහයා උඩුයටිකුරු කර ප්‍රදර්ශනය කිරීම.
   (2) රජය විසින් නියම කරනු ලබන විශේෂ දිනවල එසවීම.
   (3) ජාතික කොඩිය ඔසවන විට සියලුම දෙනා සීරුවෙන් සිටගැනීම.
   (4) හානි වූ අවලක්ෂණ වූ කොඩි ප්‍රදර්ශනය නොකිරීම.

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට පින්තූර ඇසුරින් පිළිතුරු සපයන්න.**

A



16. A පින්තූරයෙන් දැක්වෙන උත්සව අවස්ථාව නම් කරන්න.

   ..............................................................

17. එම උත්සවය සමරන ජන කණ්ඩායම් අදහන ආගම කුමක් ද?

   ..............................................................

B



18. B පින්තූරයෙන් දැක්වෙන දෑ කවර උත්සව අවස්ථාවක් හා සම්බන්ධ වේද ?

   ..............................................................

19. එම උත්සවය සමරන ජන කණ්ඩායම අදහන ආගම නම් කරන්න.

   ..............................................................

20. B පින්තූරයේ දැක්වෙන සිදුවීම් ඇතුලත් ආගමික ග්‍රන්ථය කුමක් ද?

   ..............................................................

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 04කට පිළිතුරු සපයන්න.**

01. (i) ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වශයෙන් දක්නට ලැබෙන ලක්ෂණ 03 ක් පහත දැක්වේ. ඒ සඳහා නිදසුන් 02 බැගින් ලියන්න. (ල. 06)

විවිධ ජනවර්ග ජීවත් වීම →
   1. ..............................................................
   2. ..............................................................

විවිධ භාෂා දක්නට ලැබීම →
   1. ..............................................................
   2. ..............................................................

විවිධ ආගම් දක්නට ලැබීම →
   1. ..............................................................
   2. ..............................................................

(ii) වෙසක් පොසොන් උත්සව වලදී සිදුකරන ක්‍රියාකාරකම් 04 ක් ලියන්න. (ල. 04)

   1. .............................................. 2. ..............................................

   3. .............................................. 4. ..............................................

(iii) අවමංගල අවස්ථාවකදී සහයෝගය දක්වන ස්වෙච්ඡා සංවිධාන (සමිති) 03 ක් නම් කරන්න. (ල. 03)

1. ..........................................................................................................

2. ..........................................................................................................

3. ..........................................................................................................

(iv) පුද්ගලයාගේ ජීවිතය සාර්ථක කරන සාරධර්ම තුනක් සඳහන් කරන්න. (ල. 03)

1. ..........................................................................................................

2. ..........................................................................................................

3. ..........................................................................................................

02. (i) සමාජය මගින් ළමා, තරුණ, මහලු අය ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පහත දක්වේ. එහි හිස්තැන් සඳහා සුදුසු නිවැරදි පිළිතුරු ලියන්න. (ල. 06)

| | | | |
|---|---|---|---|
| ළමයින් සඳහා → | | නොමිලේ අධ්‍යාපනය | |
| තරුණ තරුණියන් සඳහා → | වෘත්තීය පාඨමාලා | | |
| මහලු අය සඳහා → | | සුබසාධක අරමුදල් | |

(ii) වෘත්තිකයින්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා යොදා ඇති විධිවිධාන 03 ක් ලියන්න. (ල. 03)

1. ..........................................................................................................

2. ..........................................................................................................

3. ..........................................................................................................

(iii) කැමති ආගමක් ඇදහීමේ අයිතිවාසිකම හා බැඳුණු යුතුකම් 02 ක් ලියන්න. (ල. 02)

1. ..........................................................................................................

2. ..........................................................................................................


03. (i) ශ්‍රී ලාංකික අභිමානය ලොවට කියාපාන අනුරාධපුර ඓතිහාසික ප්‍රදේශයේ දක්නට ලැබෙන සංස්කෘතික දායාද 03 ක් පින්තූරවලින් දක්වේ. ඒවා නම් කරන්න. (ල. 03)



A



B



C

A. ..........................................................................................................

B. ..........................................................................................................

C. ..........................................................................................................

(ii) වර්තමාන ජාතික කොඩිය නිර්මාණය කිරීමේ කමිටුවේ සාමාජිකයින් දෙදෙනෙකු නම් කරන්න. (ල. 02)

1. ..........................................................................................

2. ..........................................................................................

(iii) රාජ්‍ය ලාංඡනයේ දක්වෙන සංකේත A තීරුවේ ද ඒවායින් නිරූපණය වන දෑ B තීරුවේ ද දක්වේ. ඒවා නිවැරදිව යා කරන්න. (ල. 06)

| A තීරුව | B තීරුව |
|---|---|
| ධර්ම චක්‍රය | පාරිශුද්ධ බව |
| වී කරල් | පරිපූර්ණ බව |
| දකුණතින් කඩුවගත් සිංහයා | සදාකාලික පැවැත්ම |
| සිංහයා වටා ඇති පළාපෙති | සෞභාග්‍යය |
| පුන්කලස | ධාර්මික බව |
| ඉර සහ සඳ | රට හා විනය ගරුක ජාතිය |

04. (i) සෑම සංස්කෘතියකම දක්නට ලැබෙන පොදු ලක්ෂණ ඇසුරින් පහත සටහන සකස් වී ඇත. එහි හිස්තැන්වලට අදාල නිවැරදි පිළිතුරු ලියන්න. (ල. 03)

| | |
|---|---|
| අධ්‍යාපනය | .................................... |
| .................................... | වැඩිහිටියන්ට සැලකීම |
| ආහාර පාන | .................................... |

(ii)



(a) ඉහත පින්තූරයෙන් දක්වෙන ක්‍රීඩාව නම් කරන්න. (ල. 01)

..........................................................................................

(b) එම ක්‍රීඩාවේදී එක් කණ්ඩායමකට තරගවදින ක්‍රීඩකයින් ගණන සඳහන් කරන්න. (ල. 01)

.................................................... (අතිරේක ක්‍රීඩකයන් හැර)

(iii) (a) ඉහත පින්තූරයෙන් දැක්වෙන ක්‍රීඩාව තුළින් පුද්ගලයා තුළ වර්ධනය කරගන්නා ගුණාංග 04 ක් ලියන්න. (ල. 04)

1. .................................................... 2. ....................................................

3. .................................................... 4. ....................................................

(b) එම ක්‍රීඩාව බහුලව යොදාගන්නා අවස්ථා දෙකක් ලියන්න. (ල. 02)

1. ..........................................................................................................

2. ..........................................................................................................

05. (i) 7 ශ්‍රේණියේ ඉගෙන ගන්නා ශිෂ්‍යයෙකු, ශිෂ්‍යාවක වශයෙන් ඔබට දිගුකාලීනව ඉටුකරගත හැකි ජීවන අරමුණු 03 ක් ලියන්න. (ල. 03)


1. ..........................................................................................................

2. ..........................................................................................................

3. ..........................................................................................................

(පවුල / පාසල / නරක මිතුරන් ඇසුර / හොඳ පොත් පත් / මත් ද්‍රව්‍ය / ආගමික කටයුතු / දුම්වැටි / වැරදි ජීවන පුරුදු)

(ii) ඉහත වරහනින් තෝරා පහත හිස්තැන් පුරවන්න. (ල. 08)




06. (i) ඔබ භාණ්ඩ මිලදී ගැනීමේදී ඇසුරුම් සහිත නිෂ්පාදන භාණ්ඩවල දක්නට ලැබෙන ලක්ෂණ 04 ක් ලියන්න. (ල. 04)

1. ..........................................................................................................

2. ..........................................................................................................

3. ..........................................................................................................

4. ..........................................................................................................

(ii) බත් වෙනුවට භාවිත කළ හැකි ආදේශක ආහාර වර්ග 04 ක් නම් කරන්න. (ල. 04)

1. ............................................................ 2. ............................................................

3. ............................................................ 4. ............................................................

(iii) ඔබගේ පවුල තුළ පවතින සම්ප්‍රදායයන් 03 ක් නම් කරන්න. (ල. 03)

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

3. ..........................................................................................................................................


07. දී ඇති උපකාරක පද උපයෝගී කරගෙන පහත දැක්වෙන ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

පහළට -

1. පුද්ගලයා තුළ වර්ධනය කරගත යුතු සාරධර්මයකි.
2. පුවත්පත්වල මේවා පළකිරීමෙන් භාණ්ඩවලට ප්‍රචාරණයක් ලැබේ.
3. තේ වෙනුවට භාවිත කළ හැකි ආදේශක පාන වර්ගයකි.
6. පොළොන්නරුවේ දක්නට ලැබෙන සංස්කෘතික දායාදයකි.
11. සමාජයේ යහපත් පුද්ගලයකු ලෙස ජීවත්වීමට ප්‍රගුණ කළ යුතු ගුණාංගයකි.

හරහට -

4. ගෘහස්ත ක්‍රීඩාවකි.
5. ක්‍රීඩා කිරීමෙන් පුද්ගලයා තුළ වැඩෙන ගුණාංගයකි.
7. සිංහල අලුත් අවුරුදු චාරිත්‍රයකි.
8. අයහපත් චිත්තවේග තත්වයන් පාලනය කරගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාකාරකමකි.
9. සෑම ප්‍රදේශයකම දක්නට ලැබෙන ස්වෙච්ඡා සමිතියකි.
10. සංස්කෘතික අනන්‍යතාව පිළිබිඹුකරන සංකේතයකි.




(ල. 11)

## I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | යුතුකම් | 02. | විල්මා රඩොල්ෆ් | 03. | ආවේණික | 04. | පවුල | 05. | ඊ.බී. ටයිලර් |
| 06. | ✓ | 07. | ✓ 08. × | 09. | × 10. ✓ | 11. | 2 | 12. | 4 13. 3 |
| 14. | 2 15. 1 | 16. | තෛපොංගල් | 17. | හින්දු 18. | | නත්තල් | 19. | කතෝලික |
| 20. | බයිබලය | | | | | | | | (2 x 20 = 40) |

## II කොටස

01. (i) • සිංහල / දෙමළ / මුස්ලිම් / බර්ගර් / මැලේ - ජනවර්ග
• බෞද්ධ / කතෝලික / ඉස්ලාම් / හින්දු - ආගම්
• සිංහල / දෙමළ / ඉංග්‍රීසි - භාෂා

(ii) සීල ව්‍යාපාර පැවැත්වීම / භාවනා වැඩසටහන් / දන්සැල් / තොරණ ඉදිකිරීම / වෙසක් කූඩු ප්‍රදර්ශනය / පෙරහැර ආදී අදාල නිවැරදි පිළිතුරුවලට ලකුණු දෙන්න.

(iii) මරණාධාර සමිතිය / සුබසාධක සමිති / බෞද්ධ සමිති / ණයදෙන සමිති ආදී අදාල නිවැරදි පිළිතුරුවලට ලකුණු දෙන්න.

(iv) විනය ගරුක බව, අවංක බව, ඉවසීම, නිහතමානී බව

02. (i) • ළමයින් සඳහා - පාසල, පෝෂණ රැකවරණය
• තරුණ තරුණියන් - රැකියා ආයතන, වෘත්තීය සමිති
• මහලු අය - විශ්‍රාම වැටුප්, සෞඛ්‍ය ආරක්ෂණය

(ii) කම්කරු නීති / සේවක අර්ථසාධක අරමුදල / රක්ෂණ ක්‍රම / වැන්දඹු අනත්දරු හා විශ්‍රාම වැටුප් / ආයතන සංග්‍රහය / මානව හිමිකම් කොමිෂම

(iii) • වෙනත් ආගම්වලට ගරු කිරීම • ආගමිකයන්ට හිරිහැර නොකිරීම • විවිධ ආගම් විවේචනයට ලක්නොකිරීම.

03. (i) A - රුවන්වැලි සෑය B - සමාධි පිළිමය C - සීගිරිය

(ii) එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා / සර් ජෝන් කොතලාවල / ජේ.ආර්. ජයවර්ධන / ටී.බී. ජායා (පෙළ පොත පිටුව 95)

(iii) ධර්ම චක්‍රය - ධාර්මික බව / වී කරල් - සෞභාග්‍යය / දකුණතින් කඩුවගත් සිංහයා - රට හා විනය ගරුක ජාතිය / සිංහයා වටා ඇති පළාපෙති - පාරිශුද්ධ බව / පුන්කලස - පරිපූර්ණ බව / ඉරහඳ - සදාකාලික පැවැත්ම

04. (i) සංස්කෘතිය පවරාදීම / සිරිත් විරිත් / බත් එළවළු පළතුරු

(ii) (a) අත්පන්දු (වොලිබෝල්) (b) 06 (හයයි)

(iii) (a) සාමය / සමගිය / සහභාගිත්වය / ජයපරාජය සමසේ විඳදරා ගැනීමේ ශක්තිය / නායකත්වයට ගරු කිරීම

(b) • සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සව අවස්ථාවලදී • පාසල් ක්‍රීඩා උත්සවවලදී
• ක්‍රීඩා සමාජවල ක්‍රීඩා තරගවලදී

05. (i) • කැමති ක්ෂේත්‍රයක ජාතික මට්ටමේ ක්‍රීඩකයෙක් වීම. • කැමති සෞන්දර්ය අංශයකින් ජාතික මට්ටමේ ජයග්‍රහණයක් ලබාගැනීම. • ගුරුවරයෙක් / ඉංජිනේරුවෙක් / වෛද්‍යවරයෙක් වීම ආදී අදාල පිළිතුරුවලට ලකුණු දෙන්න.

(ii) • හිතකර සාධක - පවුල / පාසල / හොඳ පොත්පත් / ආගමික කටයුතු
• අහිතකර සාධක - නරක මිතුරන් ඇසුර / මත්ද්‍රව්‍ය / දුම්වැටි / නරක ජීවන පුරුදු

06. (i) නිෂ්පාදිත දිනය / කල් ඉකුත්වීමේ දිනය / උපරිම සිල්ලර මිල / ශුද්ධ බර ආදි අදාල පිළිතුරුවලට ලකුණු දෙන්න.

(ii) පාන් / රොටී / පිට්ටු / කඩල / කවුපි / මුං / බතල / මඤ්ඤොක්කා / ඉදිආප්ප ආදී අදාල පිළිතුරුවලට ලකුණු දෙන්න.

(iii) • දිනපතා උදේ සවස මල්පහන් පූජා කිරීම. • නින්දට පෙර මව පියා වැඩිහිටියන්ට වැඳීම. • පවුලේ සියලු දෙනා එක්ව ආහාර ගැනීම. • ගෙදරින් පිටත ගමන් යනවිටදී දෙමාපියන්ට වැද පිටව යාම වැනි අදාල පිළිතුරුවලට ලකුණු දෙන්න.

07. <u>පහළට</u>

1. ඉවසීම 2. දන්වීම් 3. පළතුරුබීම 6. ගල්විහාරය 11.කරුණාව

<u>හරහට</u>

4. පංචදූමීම 5. සතුට 7. ගණුදෙනු කිරීම 8. ඇවිදීම 9. මරණාධාර
10. ජාතිකගීයය